රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : **34/96**

මගේ අංකය :-ආ/III/3/5
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996.11.15

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**1996 ජූනි මස 12,13 හා 14 දිනයන්හි ඇති වූ සුළි සුළගින්
සිදු වූ අලාභ හානි හේතුවෙන් රජයේ නිලධාරීන්ට
විශේෂ අත්තිකාරම් මුදලක් ලබා දීම.**

1996 ජූනි මස 12,13 හා 14 දිනවල පහත සඳහන් දිස්ත්‍රික්කයන්හි නම් කර ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඇති වූ සුළිසුළං නිසා නිවාස, දේපළ හා පෞද්ගලික බඩු බාහිරාදියට සිදු වූ අලාභ හානි සඳහා එම කොට්ඨාශවල පදිංචි , සුදුසුකම් ලබන රජයේ නිලධාරීන්ට පොළී රහිත විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට රජය තිරණය කර ඇත.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
|---|---|
| (I) බදුල්ල | හල්දුම්මුල්ල, හපුතලේ, පස්සර, වැලිමඩ, ඇල්ල බණ්ඩාරවෙල, ඌව පරණගම, හාලිඇල |
| (II) රත්නපුර | ඉඹුල්පෙ, බලංගොඩ, කොලොන්න. |
| (III)නුවරඑළිය | වලපනේ, කොත්මලේ, හඟුරන්කෙත, අඹගමුව, කෝරලේ, නුවරඑළිය. |

02. ණය මුදල ඉල්ලීමේදී නිවසට හා බඩුබාහිරාදියට සිදු වී ඇති අලාභ හානි පිළිබඳව ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතු අතර, ඇස්තමේන්තුගත මුදල හෝ නිලධාරියාගේ මාස 12 ක වැටුප හෝ යන දෙකෙන් අඩු මුදල විශේෂ ණය අත්තිකාරම් වශයෙන් ලබා දිය යුතුය.

03. නිලධාරියා හෝ ඔහුගේ පවුලේ අය පදිංචිව සිටින්නාවූද, නිලධාරියාට හෝ ඔහු නීත්‍යානුකූල විවාහ වූ කලත්‍රයාට හෝ අයිත වූද, නිවසකට / බඩුබාහිරාදියට අලාභ හානි වී තිබේ නම් ඒවා අළුත්වැඩියා කිරීම සඳහා ද මෙම ණය ලබා ගත හැකිය.

04. මෙය පොළී රහිත ණයක් වන අතර, ණය ලබාදීමේදී ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1:3, 3:1 හා 3:1:1 වගන්තිය පිළිබඳවද අවධානය යොමු කළ යුතුයි.

05. මෙම ණය මුදල්, ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3 වගන්තියේ සඳහන් වැටුපෙන් අඩු කළ හැකි මාසික අඩුකිරීම්වල එකතුවේ සීමාවන් වන , 33 1/3% හා 40% න් නිදහස් වේ.

06. ණය මුදල්, නිලධාරියාගේ වැටුපෙන් සමාන වාරික 60 කින් අය කළ යුතුය. විශ්‍රාම ගැනීමට පෙර මෙම ණය මුදල් අය කළ නොහැකි වන අවස්ථාවලදී නිලධාරියාගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂික මුදල්වලින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. එසේ ද අය කර ගත නොහැකි අවස්ථාවලදී මාසික විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

07. තාවකාලික හා නැවත සේවයේ යෙදවූ රාජ්‍ය සේවකයින්ට මෙම ණය මුදල් ලබා නොදිය යුතුය.

08. චක්‍රලේඛයේ 1 ඇමුණුම ප්‍රකාර ණය අපේක්ෂකයා විසින් සිය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ණය මුදල් අනුමත කිරීමේදී ග්‍රාම නිලධාරී වාර්තාව, කාර්මික නිලධාරීන්ගේ වාර්තාව හා අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ලබා ගත යුතුය.

09. ණය මුදල් නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් කොටස් 03 කින් නිදහස් කළ යුතුය අතර, ඒ සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරීගේ වාර්තා සැලකිල්ලට ගත යුතුය. සිදු වී ඇති හානි තක්සේරු කිරීමෙන් අනතුරුව, අනුමත වන මුළු ණය මුදලෙන් 50% ක් පළමු කොටස වශයෙන් නොපමාව නිදහස් කළ යුතු අතර, දෙවන කොටස වශයෙන් 40% ක් නිදහස් කළ යුත්තේ සිදු වී ඇති අලාභ හානියෙන් භෞතික වශයෙන් 50% ක් ප්‍රතිසංස්කරණය කළ පසුය. ඉතිරි 10% කොටස ගෙවිය යුත්තේ යෝජිත ඇස්තමේන්තුව අනුව ප්‍රතිසංස්කරණය සම්පූර්ණ වූ පසුය.

10. මෙම ණය මුදල සඳහා ඇපකරුවන් ලබා ගත යුතු අතර, ඒ සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 8/96 හි 10:4 හා 10:4:1 හි උපදෙස් අනුව කටයුතු කළ යුතුය. ඒ අනුව ඇපකරුවන් විසින් පොදු 158 දරණ ආකෘතියේ බැඳුම්කරයකට ද, ඇමුණුම් 2 ලියවිල්ලකට ද අත්සන් කළ යුතුය.

11. මෙම චක්‍රලේඛය භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

1 ඇමුණුම

# සුළි සුළං ආධාර - පොලී රහිත විශේෂ ණය අත්තිකාරම්

## <u>අයදුම්පත්‍රය</u>

### <u>1 කොටස</u>

01. නිලධාරියාගේ සම්පූර්ණ නම හා තනතුර :-

02. ලිපිනය :-

03. සේවා ස්ථානයේ ලිපිනය :-

04. අලාභ හානි වූ නිවස / දේපල පිහිටි
    ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :-

05. ග්‍රාම නිලධාරී වසම (අංකය හා නම ) :-

06. නිලධාරියාගේ මුල් පත්වීමේ දිනය හා තනතුර :-

07. දැනට දරණ තනතුර හා පත් වූ දිනය :-

08. දැනට ලබන වැටුප :-

09. සේවය ස්ථිර කර තිබේද? එසේ නම් කවද සිටද? :-

10. හානියට පත් නිවසේ අයිතිකරුගේ නම හා ලිපිනය :-
    (අලාභ හානි වූ නිවස හා දේපල වල අයිතිය අයිතිකරු විසින් තහවුරු කළ යුතුයි)

11. අලාභ හානි පිළිබඳ විස්තර (අමුණා ඉදිරිපත් කරන්න) :-

12. අලාභ හානි වෙනුවෙන් ඉල්ලනු ලබන ණය මුදල රුපියල්:- යි.

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් ප්‍රකාශ කරම සිටිමි.

.............................................

දිනය :-199 ................... අයදුම්කරුගේ අත්සන

## 11 කොටස

### (අ) ග්‍රාම නිලධාරී වාර්තාව

ග්‍රාම නිලධාරී,
..............................වසම
1996.................. දින.

ප්‍රාදේශීය ලේකම්
............................................

.................................................... මහතා /මිය / මෙනවිය ..................................දරණ ග්‍රාම නිලධාරී වසමේ අංක ............................ දරණ නිවසේ පදිංචිකරුවෙකු බවත්, 1996 ජුනි මස 12,13 හා14 දිනවල පැවති සුළි සුළඟින් ඔහු /ඇය පදිංචි නිවසට හා වෙනත් දේපලවලට අලාභ හානි සිදු වී ඇති බව සත්‍ය බවත් මෙයින් සහතික කරමි.

අත්සන :-
නම :-
තනතුර :-
(නිල මුද්‍රාව තබන්න)

දිනය :- 1996.......................

### (ආ) කාර්මික නිලධාරී වාර්තාව

කාර්මික නිලධාරී,
...........................................
...........................................
1996............................දින

ප්‍රාදේශීය ලේකම්
......................................................

**සුළි සුළං නිසා සිදු වී ඇති අලාභ හානි පිළිබඳ විස්තර**

(1) අලාභ හානි වී ඇති නිවසේ විශාලත්වය වර්ග අඩි :-..................................................................

(2) බිත්තිවල ස්වභාවය (ගඩොල්,කබොක් ,මැටි , ආදී වශයෙන් සඳහන් කරන්න) :..................................................................

(3) වහලේ ස්වභාවය (සිංහල , උළු, රට උළු, ටකරන් ඇස්බැස්ටෝස්, මාන ආදී වශයෙන්) :-..................................................................

(4) වහළය සිවිලිම සහිතද, එසේ නම් ඇස්බැස්ටෝස් තහඩු සිවිලිමක්ද, ලෑලි සිවිලිමක්ද? (යන වග) :-..................................................................

(5) වහලේ ලී වල ස්වභාවය (පොල් ලී ද, ඉරාපු ලීද, වෙනත් වර්ගයක්ද යන වග) :-..................................................................

## III කොටස

ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය

මගේ අංකය :
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
..................................................
..................................................
1996.................මස......... වන දින

..................................................
..................................................
..................................................

................................................ පදිංචි ................................................ මහතාට/ මහත්මියට / මෙනවියට සුළි සුළං හේතුවෙන් සිදු වී ඇති ඉහත සඳහන් අලාභ හානි වෙනුවෙන් විශේෂ ණය අත්තිකාරම් මුදලක් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි / නිර්දේශ නොකරමි.

ප්‍රාදේශීය ලේකම්

(නිල මුද්‍රව තබන්න)

## IV කොටස

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

................................................ පදිංචි ................................................ මහතාට/ මහත්මියට / මෙනවියට සුළි සුළං හේතුවෙන් සිදු වී ඇති අලාභ හානි වෙනුවෙන් රු...................... ක පොළී රහිත විශේෂ ණය අත්තිකාරම් මුදලක් ගෙවීම අනුමත කරමි.

අත්සන :............................................................
නම :............................................................
තනතුර :-........................................................
(නිල මුද්‍රාව තබන්න)

1996.........................................

(6) නිවසේ බිමෙහි ස්වභාවය (සිමෙන්තිද, මැටිද යන වග) :-........................................................

(7) අලාභ හානි සිදු වී ඇත්තේ නිවසේ කුමන කොටස් වලටද?

යන්න හා එහි වර්ග ප්‍රමාණයන් :-........................................................................................

(උදාහරණ :- සිවිලිම කැඩී ඇත්නම් එහි වර්ග අඩි ගණන, බිත්ති කැඩී ඇත්නම් එහි වර්ග අඩි ගණන, ජනෙල්, උළුවහු ආදිය කැඩී ඇත්නම් එම සංඛ්‍යාව හා වර්ගයන් ද දැක්විය යුතුය.)

(01) ..............................................................................................................................

(02) ..............................................................................................................................

(03) ..............................................................................................................................

(04) .............................................................................................................................

(05) ..............................................................................................................................

(06) ..............................................................................................................................

(07) ..............................................................................................................................

(08) .............................................................................................................................

(09) ..............................................................................................................................

(10) ..............................................................................................................................

(08) දේපළ වලට හෝ වෙනත් පෞද්ගලික බඩුබාහිරාදියට සිදු වී ඇති අලාභය පිළිබඳව විස්තර :-
(උදහරණ :- අල්මාරි , පුටු , මේස, ගස් කොලන් ආදී වශයෙන් ප්‍රමාණය හා වර්ගය දැක්විය යුතුය.)

| <u>සිදුවී ඇති හානි තක්සේරුව</u> | <u>වටිනාකම රුපියල්</u> |
|---|---|
| (I) නිවස | .................................................. |
| (II) බඩුබාහිරාදිය | .................................................. |

1996............................මස .............. දින........................................ මහතා / මහත්මිය / මෙනවිය පදිංචි ...................................... පිහිටි අංක දරණ නිවස ම විසින් පෞද්ගලිකව පරීක්ෂා කර බලා ඉහත සඳහන් තොරතුරු දක්වා ඇති අතර, සිදු වී ඇති එම අලාභ හානි අනුව නිවස ප්‍රතිසංස්කරණය කිරීමට හා බඩු බාහිරාදිය අළුත්වැඩියා කිරීමට දළ වශයෙන් වැය විය හැකි මුදල රු............................ (ඉලක්කමෙන් හා අකුරින් දක්වන්න) පමණ වන බව මෙයින් සහතික කරමි.

අත්සන :...........................................................

නම :............................................................

තනතුර :-.......................................................

(නිල මුද්‍රාව තබන්න)

දිනය :-........................................